# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,101 — 1962 මැයි 11 වැනි සිකුරාද — 1962.5.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 707 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 708 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 708 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 710 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 711 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 715 |
| "සුරාබද්ද අඤ්ඤපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 179**

අංකය; ඩී.31/රෙක්ට/1

### යුද්ධ හමුදුව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දිනයන්හි සිට මේජර් තනතුරට උසස් කරන ලදී:—

කපිතන් (තාවකාලික මේජර්) වරුගීස් ජෝර්ජ් ජෝර්ජ්, ල.පා.හ.—1956 ඔක්තෝබර් 1 දින

කපිතන් (තාවකාලික මේජර්) මර්වින් ඔස්වල්ඩ් ගුණරත්න, ල.සි.රෙ.—1956 ඔක්තෝබර් 6 දින

කපිතන් (තාවකාලික මේජර්) කන්දයියා රාජයෝගම්, ල.ඉ.—1956 ඔක්තෝබර් 6 දින

කපිතන් (තාවකාලික මේජර්) ඇලක්සැන්ඩර් ජෝසප් සොයිමස් නවරත්න, ඇම්.බී.ඊ., ල.යු.පො. සේ.බ.—1958 ජනවාරි 14 දින

කපිතන් (තාවකාලික මේජර්) මොහමඩ් තව්පික් මජීඩ්, ල.යු.සේ.බ.—1959 මාර්තු 7 දින

කපිතන් (තාවකාලික මේජර්) අල්පොන්සස් ජෙරාඩ් ගොඩ්ප්‍රි වැන් රයික්, ල.පා.හ.—1959 ජූනි 15 දින

කපිතන් (තාවකාලික මේජර්) මල්ලිය වඩු ගුණදාස ජෝර්ජ් රණතුංග ල.යු.පො.සේ.බ.—1959 අගෝස්තු 1 දින

කපිතන් (තාවකාලික මේජර්) අර්නස්ට් රෝයි පෙන්ඩ්ග්‍රාස්ට් ද සිල්වා, ල.හේ.පො.බ.—1960 ජනවාරි 1 දින

කපිතන් (තාවකාලික මේජර්) පෙඩ්රික් බර්න්ස් ද සිල්වා ශ්‍රී ආනන්ද, ල.සි.රෙ.—1960 ජනවාරි 1 දින

කපිතන් (තාවකාලික මේජර්) එදිරිමුනි වෙනිසන් ද සොයිසා අබේසේකර, ල.පා.හ.—1960 ජනවාරි 1 දින

කපිතන් (තාවකාලික මේජර්) රොනල්ඩ් හෙක්ටර් පෙරේරා, ල.ඉ.—1960 ජනවාරි 1 දින

කපිතන් (තාවකාලික මේජර්) හෙක්ටර් තිලක් ගුණසේකර, ල.කා.හ.—1960 මාර්තු 1 දින

කපිතන් (තාවකාලික මේජර්) බෙල්ලනගේ පර්සි ප්‍රනාන්දු ජයරත්න, ල.යු.පො.සෙ.බ.—1960 මාර්තු 1 දින

කපිතන් (තාවකාලික මේජර්) මිරිසිය ආචාරියගේ ජීවසෝම, ල.කා.හ.—1960 මාර්තු 1 දින

කපිතන් (තාවකාලික මේජර්) තොම්සන් පටුවත විතාන, ල.ඉ.—1960 මාර්තු 1 දින

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

කපිතන් (තාවකාලික මේජර්) ආනන්ද ආරච්චිගේ දෙන් බේබි පෙරේරා, ල.යු.යු.බ.—1960 මාර්තු 1 දින

කපිතන් (තාවකාලික මේජර්) බටුවත්ත ගමගේ සැමසන් ද සිල්වා, ල.ඉ.—1960 අගෝස්තු 30 දින

කපිතන් (තාවකාලික මේජර්) ඉයුස්ටස් සෙඩ්රික් ජැන්සන්, ල.ඉ.—1960 ඔක්තෝබර් 1 දින

කපිතන් (තාවකාලික මේජර්) ජෝන් ඩෙන්සිල් සොයිසා, ඇම්.බී.ඊ., ල.පා.හ.—1961 පෙබරවාරි 1 දින

කපිතන් (තාවකාලික මේජර්) තුවන් සමයිරාන් බුහාරි සලී, ල.සි.රෙ.—1961 ජූලි 13 දින

උතුමාණන් වහන්සේගේ අණපරිදි,
ඇන්. ක්‍යූ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් 27 වෙනිද,
කොළඹ දීය.
5–226

---

1962 අංක 180

අංකය : ඩී/වීඑෆ්ජ්/17ඒ.

## යුධ හමුදව—ලංකා ස්වෙච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ද්විතීයන අවසන් කිරීම

නිත්‍ය හමුදවේ සේවය පිණිස ද්විතීයනය කරන ලද පහත නම් සඳහන් නිලධාරින්ගේ සේවය පහත සඳහන් දිනයන්හි සිට අවසන් වනු ඇත ;—

(ඒ) 1962 පෙබරවාරි මස 22 වැනි දින සිට—

ලෙප්ටිනන්ට් පර්සි ඇලෙක්සැන්ඩර් ද සිල්වා ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් මේස්කි මෝසස් පුන්චිහෙට්ටි ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් නීලෙට්ටි ඕදිරිස් ද සිල්වා ... ල.ශී.බ.
උප ලෙප්ටිනන්ට් හෙට්ටියාදුර විජය රන්ජිත් මෙන්ඩිස් කරුණාරත්න ... ... ... ල.ශී.බ.
උප ලෙප්ටිනන්ට් විජේසූරිය මුදියන්සේලාගේ කුඩා බණ්ඩා ල.ශී.බ.

(බී) 1962 පෙබරවාරි මස 23 වැනි දින සිට—

ලෙප්ටිනන්ට් ලයනල් එඩ්වර්ඩ් පෙරේරා විජයවර්ධන ජයතිලක ... ... ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් මාතරගේ දයා චන්ද්‍රරත්න කරුණාසේකර ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් ආතර් පියදස රණවීර ... ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් ලූල්බද්දවඩුගේ උපාලි මනෝරත්න ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් රන්බණ්ඩා විජේකෝන් ... ... ල.ශී.බ.

(සී) 1962 මාර්තු මස 1 වැනි දින සිට—

ලෙප්ටිනන්ට් වඩුතන්තිරිගේ හෙන්රි ද සිල්වා ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් කංකානි තන්ත්‍රි ඉන්ද්‍රසිරි සෝමපාල ද සිල්වා ල.ශී.බ.
ලෙප්ටිනන්ට් බණ්ඩාරනායක මහමුදියන්සේලාගේ සෙනෙවිරත්න ලොකු බණ්ඩාර අමරනායක ... ... ල.ශී.බ.

(ඩී) 1962 මාර්තු මස 3 වැනි දින සිට—

ලෙප්ටිනන්ට් දෙන් කරුණාසේන කුලසේකර ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් නායක බණ්ඩාරලාගේ සිරිසේන බලල්ල ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් ලයනල් සමරරත්න ... ... ල.ශී.බ.

(ඊ) 1962 මාර්තු මස 4 වැනි දින සිට—

ලෙප්ටිනන්ට් බුවනෙකබාහු රාජකරුණා වාසල මුදියන්සේලාගේ සෙනෙවිරත්න බණ්ඩා තෝරදෙනිය ... ල.ශී.බ.
ලෙප්ටිනන්ට් දීග තන්ත්‍රිගේ ඩග්ලස් ද සිල්වා ... ල.ශී.බ.

(එෆ්) 1962 මාර්තු මස 6 වැනි දින සිට

ලෙප්ටිනන්ට් අබ්දුල් මජීඩ් ඕමාර් මූලාර් ... ... ල.ශී.බ.

(ජී) 1962 මාර්තු මස 7 වැනි දින සිට—

ලෙප්ටිනන්ට් අලවතුරගේ නිමලන්දන පෙරේරා ... ල.ශී.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ක්‍යූ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අප්‍රියෙල් 25 වෙනිද, කොළඹ දීය.

5–279

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 181

ඒ. 80/62.

1962 මාර්තු මස 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක සී. මයිල්වාගනම් මහතා ආනයන හා අපනයන පාලක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 150/61.

1961 මාර්තු මස 1 වැනි දින සිට බී. රාසයියා මහතා ජල සම්පාදන සහ ජලාපවහන අධ්‍යක්ෂක වශයෙන්.

ඒ. 114/62.

1962 මාර්තු මස 26 වැනි දින සිට වී. සච්චානන්දම් මහතා නැවත වැඩ භාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු හෝ ජාතික මුදල් ඉතිරි කිරීමේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ඇල්. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා ජාතික මුදල් ඉතිරි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වශයෙන් තාවකාලිකව වැඩ බැලීමට.

ඒ. 68/62

1962 මාර්තු මස 12 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න මහතා පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ 83/62.

1962 අප්‍රේල් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සිවිල් සේවක වී. පී. විට්ටාච්චි මහතා යාපනය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 77/62

1962 මාර්තු මස 26 වැනි දින සිට 1962 අප්‍රේල් මස 30 වැනි දින දක්වා සිවිල් සේවක ඇන්. පී. විජයරත්න මහතා නිවාඩු පිට සිටින කාලය තුළදී හෝ නැවත නියමයක් කරන තුරු අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආණ්ඩුවේ ඒජන්ත සිවිල් සේවක ඒ. බී. ඇල්කඩුව මහතා සවකීය රාජකාරිවලට අතිරේකව අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 120/62

1962 මාර්තු මස 19 වැනිදා සිට නැවත නියමයක් කරන තුරු සමුපකාර සංවර්ධන සහ සමුපකාර සමිති ලියා පදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වරයාගේ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් ආර්. සමරසේකර මහතා එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 67/62

1962 මාර්තු මස 7 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක සී. නාරයනසාමි මහතා, සහකාර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මැයි මස 7 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායභාලයේදීය,

තැ. පෙ. 500.
5-426

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1962 අංක 182

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඒ. 4/48.

එල්. සමරතුංග මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 4 වැනි දින සිට බදුල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක. එල්. 1700, එම්. 718, එම්. 1951, එම්. 1441, එම්. 1948, පී. 679, එම්. 1288, එම්. 13520, එම්. 1035, පී. 13160 සහ එම්. 2146 දරණ නඩු අවසාන වන තුරු ඇහීමට හා තීන්දු දීමට, බදුල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1962 අප්‍රෙල් 30 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කුරුණෑගල, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 19/48.

ඩී. ඊ. ධර්මසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රෙල් 25 වැනි දින සිට, ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 18012 දරණ නඩුවේ තීන්දුව දීමට, ගාල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. පී. සී. කැරන් මහතා 1962 අප්‍රෙල් 27 වැනි හා 28 වැනි දිනයන්හි, මීගමුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා මීගමුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 17සී/62.

ඒ. එම්. අමීන් සහ ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජී. එච්. සඳසිංහ මහතා 1962 අප්‍රෙල් 28 වැනි දින සිට 30 වැනි දින දක්වා, (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදූල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රිකුවෙස්ට් කොමසාරිස් ධුරයට හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදූල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 23ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ඒ. ඊ. මීගම මහතා 1962 මැයි 10 වැනි දින සිට 15 වැනි දින දක්වා, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පානදුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. ඇස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. පී. විජයතිලක් මහතා 1962 මැයි 4 වැනි දින සිට 7 වැනි දින දක්වා, මාතලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. ඩී. ඉසැඩ්. ගුණවර්ධන මහතා 1962 අප්‍රෙල් 26 වැනි දින, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 9ඒ/52.

ඊ. ඕ. එෆ්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්, ද සිල්වා මහතා 1962 අප්‍රෙල් 26 වැනි දින, කළුතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6/සී/52ඒ.

වී. එම්. කුමාරසාමි මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, කේ. රත්නසිංහම් මහතා 1962 අප්‍රෙල් 27 වැනි දින සිට, පේදුරුතුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා පේදුරු තුඩුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16බී/61.

එන්. ඩබ්ලිව්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 අප්‍රෙල් 27 වැනි, 28 වැනි හා 30 වැනි දිනයන්හි, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

වී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1962 මැයි 3 වැනි දින සිට 7 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 13ඒ/59.

වී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 මැයි 7 වැනි හා 8 වැනි දිනයන්හි, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 27ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 මැයි 4 වැනි දින සිට 7 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 61/48.

එන්. සිවඥානසුන්දරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. මුත්තුසාමිපිල්ලේ මහතා 1962 මැයි 3 වැනි දින සිට 5 වැනි දින දක්වා, යාපනේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 58ඒ/59.

බී. සේනාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසිර්වාදම් මහතා 1962 මැයි 9 වැනි දින සිට 11 වැනි දින දක්වා, රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 65ඒ/61.

ජේ. බී. සී. සුවාරිස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එල්. එස්. බී. පෙරේරා මහතා 1962 මැයි 4 වැනි දින සිට, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බදුල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේආර්එම්. 4/52.

ඒ. එස්. හේරත් ගුණරත්න මහතා 1962 අප්‍රෙල් 22 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයට.

අංකය : ජේආර්එම්. 4/52.

එච්. එස්. තිලකරත්න මහතා 1962 අප්‍රෙල් 22 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ සහ කටුගම්පොල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයට.

අංකය : පීඑල්./ජී. 2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ඩබ්ලිව්. ගුණසේකර මහතා 1962 මැයි 2 වැනි හා 3 වැනි-දිනයන්හි, රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරලේ හා කොලොන්න කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./වයි. 1/48.

එස්. ඒ. යටවර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා 1962 අප්‍රෙල් 26 වැනි දින, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පලාතේ සහ බටහිර නුවරගම් පලාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීජ්ඒ. 55/7.

ඒ. ජේ. සහීඩ් මහතා 1962 මැයි 22 වැනි දින, වලගෙදර ගම්බද උසාවියේ අංක 3430 දරණ අපරාධ නඩුව ඇහීමට, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර සහ බස්නාහිර පස්දුන් කෝරලයන්හි සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීජ්ඒ. මිශ්‍ර/57.

කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා 1962 මැයි 2 වැනි දින සිට 5 වැනි දින දක්වා, 7 වැනි, 9 වැනි දින සිට 11 වැනි දින දක්වා, 15 වැනි දින සිට 17 වැනි දින දක්වා, 21 වැනි, 23 වැනි දින සිට 25 වැනි දින දක්වා, 28 වැනි දින සිට 31 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු හුරුළු පලාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කලාගම් පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./එෆ්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එස්. එම්. ධීරරත්න මහතා 1962 අප්‍රෙල් 26 වැනි දින සිට 28 වැනි දින දක්වා සහ 30 වැනි දිනද, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතරේ සහ වැලිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට සහ ගහබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තැව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවල් මහතා 1962 අප්‍රෙල් 27 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./ඒ. 9/61.

ඒ. එම්. එම්. අලාහුදින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. කුමාරනායගම් මහතා 1962 මැයි 14 වැනි දින සිට 17 වැනි දින දක්වා, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./ඒ. 8/61.

ඒ. අලගයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. සී. එම්. මීරා සාහිබු මහතා 1962 මැයි 2 වැනි දින සිට 4 වැනි දින දක්වා, මඩකලපු දිස්ත්‍රික්කයේ, කරවාකු, නින්තාවූර්, සමන්තුරේ සහ වැවුගම් පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්./ඒ. 10/62.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1962 මැයි 14 වැනි දින සිට 17 වැනි දින දක්වා, මඩකලපු දිස්ත්‍රික්කයේ එරුවිල් පොරටිව් සහ දකුණු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මැයි 4 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය : 573,
කොළඹ 12.

5-344

---

## වෙනත් පත් කිරීම් ආදිය

### 1962 අංක 183

### ගැසට් නිවේදනයයි

අංකය : අයිඑන් කියු/එල්. 1/1/62.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ (20 වෙනි පරිච්ඡේදයේ) 120 වෙනි වගන්තිය යටතේ ගරු වැඩබලන අධිකරණ ඇමතිතුමා විසින්—

1962, අප්‍රේල් මස 14 වෙනි දින සිට එම්. ජස්ටින් ද සිල්වා මහතා නැවත වැඩ භාර ගන්නාතුරු කොළඹ දිස්ත්‍රික්කයේ, කඳවෙල කටාන ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට එල්. ඒ. ගනේපොල මහතාද,

1962, අප්‍රේල් මස 19 වෙනි දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉහළ ඕතොට කෝරළේ හදිසි මරණ පරීක්ෂකවරයකු වශයෙන් ඩබ්ලිව්. බී. ඇහැලේපොල මහතාද,

1962, අප්‍රේල් මස 19 වෙනි දින සිට අම්පාර දිස්ත්‍රික්කයේ, සම්මාන්තුරේ මධ්‍යම කඳවුර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයකු වශයෙන් සී. ජයසේකර මහතාද,

1962, අප්‍රේල් මස 19 වෙනි දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩපොල ඕතොට බස්නාහිර කෝරළයේ හදිසි මරණ පරීක්ෂකවරයකු වශයෙන් එම්. ආර්. පොඩිඅප්පුහාමි මහතාද,

1962 අප්‍රේල් මස 23 වෙනි දින සිට ඩී. එස්. මීගල්ල මහතා නැවත වැඩ භාර ගන්නාතුරු, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ නැගෙනහිර කොට්ඨාශයේ (උඩුගහපත්තු) හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඩී. ඒ. එස්. අලගියවන්න මහතාද

පත් කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1962 මැයි මස 4 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

5-360

---

### 1962 අංක 184

### ගැසට් නිවේදනයයි

අංක. ඒ. ඕ. 1958.

ආඥාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

සමාදාන විනිශ්චයකාරවරු

(1) හිල්මි ෆාරුක් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(2) ජස්ටින් එස්. පෙරේරා මහතා කලුතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(3) යූ. බී. ඒමිස් මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත් කර ඇත්තේ ය.

---

1947 සැප්තැම්බර් මස 18 වෙනි දින ආඥාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ප්‍රකාශයකින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිවුරුම් පත්‍ර පිළියෙළ කිරීමට අවශ්‍ය වන සහතික කිරීම් හෝ දිවුරීම් හෝ කරවීමට විශේෂයෙන් බලය පවරා ඇති නිලධාරියකු වශයෙන් කේ. පී. එෆ්ජ්. ඈන්තනි පෙරේරා මහතා කුලියාපිටියේ පිස්කල් මාර්ෂල් තැන වශයෙන් වැඩබලන කාලයතුල කුරුණෑගල අධිකරණ කොට්ඨාශය සඳහා 1962 අප්‍රේල් මස 13 වෙනි දින සිට 21 වෙනි දින දක්වා පත් කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1962 මැයි මස 4 වැනි දින.
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

5-359

---

### 1962 අංක 185

### දැන්වීමයි

සුදත්ත මහින්ද ඩයස් ජයසුන්දර මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්

1962 මැයි මස 3 වැනි දින,
කොළඹ දී ය.

5-436

---

### 1962 අංක 186

### දැන්වීමයි

වැලිපිටිගොඩ ජයතිලක ආයසිරත්න විමලධම් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි මස 3 වැනි දින,
කොළඹ දී ය.

5-384/2

---

### 1962 අංක 187

### දැන්වීමයි

ගජසිංහ ආරච්චිගේ ජර්මෙන් ඇල්ප්‍රඩ් ද සිල්වා මහතා හලාවත අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි මස 3 වැනි දින,
කොළඹ දී ය.

5-384/1

# ආණ්ඩුවේ නිවේදන

අංකය. පීආර්/ඒඑෆ්/97.

## ගැසට් නිවේදනය

ආර්. ඇම්. මැකින්ටයර් මහතා කොළඹ සිටින තුර්කියේ ගරු කොන්සල් වශයෙන් වැඩ කටයුතු නොකරන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කර සිටී.

ඇන්. කෘ. දියෙස්,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 28 වෙනි දින,
කොළඹ 1, සෙනෙට් මන්දිරයෙහි,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ දී ය.

5-247/1

---

අංකය. පීආර්/ඒඑෆ්/97.

## ගැසට් නිවේදනය

ඕ. බී. ඊ. නාමධාරී ස්ටැන්ලි පේදිරික් ද සේරම් මහතා කොළඹ සිටින තුර්කියේ ගරු කොන්සල් වශයෙන් තාවකාලිකව පිළිගැනීමට ගරු විදේශ කටයුතු භාර ඇමතිනිය සතුටුවී ඇත.

ඇන්. කෘ දියෙස්,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 28 වෙනි දින,
කොළඹ 1, සෙනෙට් මන්දිරයෙහි,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ දී ය.

5-247/2

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

රබර් වැවීමේ සහ සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ජේ. ඩබ්ලිව්. ක්‍රෝග් මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් ඊ. ඕ. බී. ලවර් මහතා පත් කරන ලද බව, වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්වරයා.

1962 මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

5-323

---

ඇල්.ඕ.—බී. 17/58.

## 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත

වර්ෂ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 46 වන වගන්තියෙන් ලැබී ඇති බලය පිට කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදිත නියෝගයයි.

ඇම්. පී. ද ඉසඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා ඇමති.

1962 මාර්තු මස 29 වැනි දින,
කොළඹදීය.

### නියෝගය

වර්ෂ 1958 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 11,573 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළකරන ලද්දාවූත් ඉන්පසු කලින් කල වෙනස් කරන ලද්දාවූත් 1958 සේවක අර්ථ සාධක අරමුදල් නියෝග මෙහි පහත දක්වෙන පරිද්දෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ :—

(1) 7 වන නියෝගය අස්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අභිනව නියෝගය යෙදීමෙන් :—

"7 (1) (2) වන ඡෙදයෙහි සඳහන්ව ඇති සේවයෝජකයකු නොවන්නාවූත් පනත යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට බැඳී සිටින්නාවූත් සෑම සේවයෝජකයෙක් එසේ ඔහු බැඳී සිටින්නාවූ එක් එක් මාසය වෙනුවෙන්—

(ඒ) ඒ මාසයට ගෙවිය යුතුව ඇති දායක මුදල්, මෙයට යාකොට ඇති දෙවන උප ලේඛනයෙහි දැක්වෙන "සී" ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ වාර වාර්තාවක් ද සමග, ශ්‍රී ලංකා මහා බැංකුව වෙත යැවිය යුතුය ; තවද

(බී) ඒ සමගම, එම වාර වාර්තාවේ අනුපිටපතක් කොමසාරිස්වරයා වෙත යැවිය යුත්තේ ය.

(2) පනත යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට බැඳී සිටින්නාවූත් එසේ පළමුවරට බැඳුණු හෝ බැඳෙන්නාවූ දිනෙන් පසුව අනුක්‍රමයෙන් පැමිණෙන තුන් මාසයක් තුළ, රක්ෂිතවූ වෘත්තියක සාමාන්‍යයෙන් 150 දෙනෙකුට නො අඩු සේවකයන් ගණනක් සේව්‍යයෙහි යොදවාගෙන සිටින්නාවූත් සෑම සේවයෝජකයෙක්, 3 වන ඡෙදයෙහි විධිවිධානවලට යටත්ව—

(ඒ) එසේ ඔහු බැඳී සිටින්නාවූ එක් එක් මාසය වෙනුවෙන්—

(i) ඒ මාසයට ගෙවිය යුතුව ඇති දායක මුදල්, යවන ඒ මුදල පිළිබඳව මෙයට යාකොට ඇති දෙවන උප ලේඛනයෙහි දැක්වෙන "සී(1)" ආකෘතියට සාරානුකූලව පිළියෙල කළාවූ නිවේදනයක් ද සමග, ශ්‍රී ලංකා මහා බැංකුව වෙත යැවියයුතුය, තවද

(ii) ඒ සමගම, යවන මුදල් පිළිබඳ එම නිවේදනයේ අනුපිටපතක්, ඒ මාසයේ ඇතිවූ වෙනස්කම් පිළිබඳව මෙයට යාකොට ඇති දෙවන උප ලේඛනයෙහි දක්වෙන "සී (2)" ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ වාර්තාවක් ද සමග, කොමසාරිස්වරයා වෙත යැවිය යුත්තේ ය.

(බී) එක් එක් වර්ෂයේ පිළිවෙලින් ජූනි සහ දෙසැම්බර් යන මාසවලින් අවසන්වන නොකැඩී පැවැති එක් එක් හයමස් කාල පරිච්ඡෙදය වෙනුවෙන්—

(i) ඒ වර්ෂයේ පිළිවෙලින් ජූලි මස අවසාන දිනට පෙර හෝ ඊට ලඟ වර්ෂයේ ජනවාරි මස අවසාන දිනට පෙර හෝ මෙයට යාකොට ඇති දෙවන උප ලේඛනයෙහි දක්වෙන "සී (3)" ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ වාර්තාවක් ශ්‍රී ලංකා මහා බැංකුව වෙත යැවිය යුතුය, තවද

(ii) ඒ සමගම, එවැනි එක් එක් වාර්තාවේ අනුපිටපතක් කොමසාරිස්වරයා වෙත යැවිය යුත්තේ ය.

(3) එසේ කිරීම අවස්ථානුකූලයැයි හෝ යෝග්‍යයැයි තමා කල්පනා කරන්නේ නම් ලිඛිත ආඥාවක් කිරීමෙන් (2) වන ඡෙදයෙහි සඳහන් කවර සේවයෝජකයකුට වුවත් (1) වන ඡෙදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන මෙන් විධාන කිරීමට කොමසාරිස්වරයාට පුළුවන. එසේ විධාන කරනු ලැබූ එවැනි කවර සේවයෝජකයෙක් වුවත් එම ආඥාව කොමසාරිස්වරයා විසින් අවලංගු කරනතාක් කල් (2) වන ඡෙදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු වෙනුවට (1) වන ඡෙදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(2) 9 වන නියෝගයෙහි "දෙවන උප ලේඛනයේ "සී" ආකෘතියේ" යන ස්ථානයේ සිට එම නියෝගයේ අවසානය දක්වා ඇති සියලුම වචන අස්කොට ඒ වෙනුවට පහත දක්වෙන වචන යෙදීමෙන් :—

"එක් එක් මාසය වෙනුවෙන් එම සේවයෝජකයා විසින් අරමුදලට යවන ලද දායක මුදල් පිළිබඳව මෙයට යාකොට ඇති දෙවන උප ලේඛනයේ "සී" ආකෘතිය සහ "සී (3)" ආකෘතිය යන මින් උචිත ආකෘතියෙහි වූ සටහනක්"

(3) 17 වන නියෝගයෙන් පසුව ඊලඟටම පහත දක්වෙන අභිනව නියෝගය යෙදීමෙන් :—

"17ඒ. (1) යම් සේවකයෙක් එම සේවකයා වෙනුවෙන් අරමුදලට දායකමුදල් ගෙවීමට බැඳී ඇති සේවයෝජකයන් දෙදෙනකු යටතේ එකවර සේවය කරතියි කොමසාරිස්වරයා සිතන්නේ නම් මෙයට යාකොට ඇති දෙවන උපලේඛනයෙහි

දැක්වෙන "ආර්" ආකෘතියට සාරානුකූලව පිළියෙළ කළ ප්‍රකාශයක් එම සේවකයාගෙන් ලබාගෙන තමා වෙත එවන මෙන් එකී සේවයෝජකයන් දෙදෙනාටම හෝ ඉන් එක් කෙනකුට හෝ ලියා දන්වා විධාන කිරීමට කොමසාරිස් වරයාට පුළුවන.

(2) සේවකයකුගෙන් (1) වන ඡේදයෙහි සඳහන් ප්‍රකාශය ලබාගන්නා මෙන් කොමසාරිස්වරයා විසින් එම ඡේදය යටතේ යම් සේවයෝජකයකුට විධානයක් කරනලද කල්හි එම සේවයෝජකයා ඒ විධානයට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(4) 26 වන නියෝගයේ (1) වන ඡේදයෙහි "ඔහුගේ පවුල" යන වචන අස්කොට ඒ වෙනුවට "ඔහුගේ පවුල, හෝ ඔහුගේ පියා, මව, සහෝදරයා හෝ සහෝදරී" යන වචන යෙදීමෙන් ;

(5) 29 වන නියෝගයේ (3) වන ඡේදයෙන් පසුව ඊළඟටම පහත දැක්වෙන අභිනව ඡේදය යෙදීමෙන් :—

"(4) මෙම නියෝගයෙහි ඉහතින් සඳහන්වූ විධිවිධාන අනුව අඩු වයස්කාරයකු වෙනුවෙන් යම් ප්‍රතිලාභයක් භාර ගැනීමට යම් තැනැත්තකු නම් කිරීමට සාමාජිකයකු අපොහොසත්වී ඇති කල්හි කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද යම් නිලධාරියකුට, ඊට අදාළ කරුණු අනුව එම අඩු වයස්කාරයාගේ භාරකරු හැටියට කොමසාරිස්වරයා හෝ එම නිලධාරියා විසින් සලකනු ලබන කවර තැනැත්තකුට වුවත්, එම ප්‍රතිලාභය ගෙවිය හැකිය." ;

(6) 42 (1) වන නියෝගයෙහි—

(ඒ) එහි (කේ) අක්ෂරය දරන අංකයෙන් එන "සියයට හැත්තෑ පහකට" යන වචන අස්කොට ඒ වෙනුවට "සියයට හතලිහකට" යන වචන යෙදීමෙන් ; සහ

(බී) (කේ) අක්ෂරය දරන අංකයට පසුව ඊළඟට පහත දක්වෙන අභිනව අංකය යෙදීමෙන් :—

"(කේ කේ) සාමාජිකයන්ට ණය දෙන්නාවූ කායනී යන් කොමසාරිස්වරයා විසින් අනුමත කළ යුතුය";

(7) 60 වන නියෝගයේ (3) වන ඡේදයෙහි එන "කෑලි ගණනේ" යන වචන අස් කොට ඒ වෙනුවට පහත දක්වෙන ඛණ්ඩය යෙදීමෙන් :—

"කෑලි ගණනේ පාරිශ්‍රමිකය සහ සේවයෝජකයාට කරන ලද යම් සේවයක් වෙනුවෙන් ඔහුට වට්ටම් වශයෙන් ගෙවන ලද යම් පාරිශ්‍රමිකයක් වේ නම් එයද"

(8) 61 වන නියෝගයේ (1) වන ඡේදය අස් කොට ඒ වෙනුවට පහත දක්වෙන අභිනව ඡේදය යෙදීමෙන් :—

"(1) පනතෙහි විධිවිධාන යටතේ හෝ මෙම නියෝග යටතේ හෝ අරමුදලට කරනු ලබන්නාවූ සෑම ගෙවීමක් මහ බැංකුවේ මුදල් ශාඛාවට මුදලින් ගෙවීමෙන් හෝ, එසේ නැත්හොත් මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුම කින් හෝ කවර හෝ වෙළඳ බැංකුවකින් මුදල් අස්කර දෙමින් සේවක අර්ථ සාධක අරමුදලේ මහා බැංකු ගිණුම නමට ලියූ චැක්පතකින් හෝ, එසේත් නැතහොත් කලින් කලට පොදු වශයෙන් නැතහොත් යම් විශේෂ අවස්ථාව කට අදාළ විශේෂ තත්ත්වයන් අනුව මුදල් මණ්ඩලය මඟින් නියම කරන වෙන යම් අන්දමකින් හෝ, කළ යුතුය.".

(9) 62 වන නියෝගයෙහි—

(ඒ) එහි (1) වන ඡේදයේ—

(i) "යම් දයක මුදලක්" යන වචන අස්කොට ඒ වෙනුවට "සේවයෝජකයන් විසින් වැරදීම කින් අරමුදලට යම් මුදලක් ගෙවා ඇති විට හෝ යම් දයක මුදලක්" යන වචන යෙදී මෙන් ; සහ

(ii) "එවැනි දයක මුදල් (වැරදීමකින් ගෙවා ඇති බව) ඒත්තු ගියවිට" යන වචන අස් කොට ඒ වෙනුවට "එවැනි මුදල් හෝ එවැනි දයක මුදල් (වැරදීමකින් ගෙවා ඇති බව) ඒත්තු ගියවිට" යන වචන යෙදීමෙන් ;

(බී) එහි (2) වන ඡේදයේ "යම් දයක මුදලක්" යන වචන අස්කොට ඒ වෙනුවට "යම් මුදලක් හෝ දයක මුදලක්" යන වචන යෙදීමෙන් ;

(සී) එහි (3) වන ඡේදයේ—

(i) "යම් දයක මුදලක්" යන වචන අස් කොට ඒ වෙනුවට "යම් මුදලක් හෝ දයක මුදලක්" යන වචන යෙදීමෙන් ; සහ

(ii) "දයක මුදල්" යන වචන අස්කොට ඒ වෙනු වට "එවැනි මුදල් හෝ දයක මුදල්" යන වචන යෙදීමෙන්,

(10) එයට යාකොට ඇති පළමුවන උප ලේඛනය අස් කොට ඒ වෙනුවට පහත දක්වෙන උප ලේඛනය යෙදීමෙන් :—

"පළමුවන උප ලේඛනය"

මෙහි පහත සඳහන් වෘත්තීන් නොවන්නාවූ සෑම වෘත්තියක්—

(ඒ) ලංකාණ්ඩුව යටතේ වූ වෘත්තීන් ; හෝ

(බී) 1945 අංක 43 දරන පළාත් සේවා ආඥාපනත යටතේ පිහිටුවා ඇති පළාත් පාලන සේවා කොමිෂන් සභාව යටතේ වූ වෘත්තීන් ; හෝ

(සී) ලිඛිත වෙන යම් කිසි නීතියක් යටතේ තම සේවක යන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක අරමුදලක් පිහිටුවා ඇති මණ්ඩලයක් වන යම් පළාත් පාලන මණ්ඩලයක් යටතේ වූ වෘත්තීන් හෝ වේ.

මේ උප ලේඛනයේ "පළාත් පාලන මණ්ඩලය" යන පාඨයෙන් කවර හෝ නාගරික සභාවක්, පළාත් ආණ්ඩු සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් කෙරෙයි."

(11) එයට යාකොට ඇති දෙවන උප ලේඛනයෙහි—

(1) "සී" ආකෘතියෙන් පසුව ඊළඟටම පහත දක්වෙන අභිනව ආකෘති පත්‍ර යෙදීමෙන් :—

(7 (2) (ඒ) (1) වන නියෝගය)

සී (1) ආකෘති පත්‍රය

**මහ බැංකුවේ කාර්යාංශයට දායක මුදල් යැවීමේ දී කරන නිවේදනය**

සේවයෝජකයාගේ ලියාපදිංචිවීමේ අංකය.............. සහ ලිපිනය ........................................................ දායක මුදල් යවන්නේ කිනම් මාසයක් වෙනුවෙන් ද යන වග 196........... යවන මුදල වූ රු. ................. ශත ............ මුදලින්/මුදල් ඇණවුමකින්/ තැපැල් ඇණවුමකින්/චැක්පතකින් එවනු ලැබේ.

යවන දිනය :.........................

————————,
සේවයෝජකයාගේ අත්සන.

සැ. යු.—මේ නිවේදනයේ පිටපත් දෙකක් පිළියෙල කළ යුතුය. මුල් පිටපත මුදලුත් සමඟ කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ සුපිරින්ටැන්ඩන්ට් තැන වෙත යැවිය යුතුය.

අනුපිටපත කම්කරු කොමසාරිස්වරයා වෙත යැවිය යුතුය.

(7 (2) (ඒ) (11) වන නියෝගය)

සී (2) ආකෘතිය

**19...................................... මාසය වෙනුවෙන් වෙනස්කම් පිළිබඳ වාර වාර්තාව**

කම්කරු කොමසාරිස්වරයා වෙතටයි.

සේවකයාගේ ලියාපදිංචිවීමේ අංකය

| සේවකයාගේ අංකය | සේවකයාගේ නම | අස්වගියේද/වැඩිවයස් වූයේද/මියගියේද අලුත් සේවකයෙක්ද යන වග | වෙනත් කිවයුතු කරුණු |
|---|---|---|---|

————————,
සේවයෝජකයාගේ අත්සන.

සටහන :—එක් එක් සේවකයා සම්බන්ධයෙන් "ඊ", "ඇෆ්ජ" හෝ "ජී" යන මින් උචිත ආකෘතියේ වූ ප්‍රකාශයක් මේ ආකෘතියත් සමග යැවිය යුතුය. සේ. අ. අරමුදලේ සාමාජිකයකු නොවූ සේවකයකු වූ කල්හි නිසි පරිදි පුරවා සම්පූර්ණ කර "ඒ", "බී" සහ "එච්" ආකෘති පත්‍ර යැවිය යුතුය.

[7 (2) (බී) නියෝගය]

**සී (3) වන ආකෘතිය—වර්ෂ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත**

**196... ජූනි 30 වන/දෙසැම්බර් 31 වන දිනින් අවසන් වන අර්ධ වර්ෂය සඳහා වාර වාර්තාව**

සැ.යු.—(ඒ) සී (3) ආකෘතියෙහි 3 වන තීරය හැර අන් සෑම කොටුවක්ම පිරවිය යුතුයි.

(බී) වාර වාර්තාව නිවැරදියැයි සහතික කිරීමට පෙර එහි 4 වන තීරයේ (කෙලින් අතට එකතු කළ විට ලැබෙන) එකතුව 11 වන තීරයේ (හරස් අතට එකතු කළ විට ලැබෙන) එකතුවට සමාන විය යුතු බව ගැන සේවායා වග බලා ගතයුතුය.

(සී) මුළු දළ වේතනයට, මූලික වේතනය හෝ මාසයේ වැටුප ද ජීවන වියදම් දීමනාව ද කැලි ගණනේ ගෙවීම් ද පෙළඹවීමේ ගෙවීම් ද ආහාරවල වටිනාකම ද නිවාඩු ගෙවීම් වේතන සහ වෙනත් එවැනි ගෙවීම් ද ඇතුළත් වන නමුත් අතිකාල ගෙවීම් ඇතුළත් නොවිය යුතුය.

මුළු කොළ ගණන :.................................

දයක මුදල් ගෙවනු ලැබූ සේවකයන්ගේ මුළු ගණන : ........................

* අදාල නොවන්නා වූ පේළිය කපා හරින්න.

0 එවනු ලබන සී (3) ආකෘතිය අදාල වන කාල පරිච්ඡේදය සඳහා ගෙවන ලද දයක මුදල් සහ සී (3) ආකෘතියෙහි මුළු එකතුව අතර යම් වෙසක් වේනම්, එය 6 වන තීරයෙහි පැහැදිළි කළ යුතුයි.

| (1) | (2) | (3) | | (4) | (5) දළ වේතන වල සහ දයක මුදල් වල එකතුව | | | | | | | | | | | | (6) | (7) | (8) | (9) | (10) එක් එක් මාසය තුළදී වැඩ කළ දින ගණන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාජිකයාගේ නම (වාසගම මුලින්ද මුලකුරු පසුවද ලියන්න) | සාමාජිකයාගේ අංකය | කාර්යාලයේ ප්‍රයෝජනය පිණිසයි | | දයක මුදල් වල එකතුව | * ජනවාරි * ජූලි | | පෙබරවාරි අගෝස්තු | | මාර්තු සැප්තැම්බර් | | අප්‍රියෙල් ඔක්තෝබර් | | මැයි නොවැම්බර් | | ජූනි දෙසැම්බර් | | වෙනත් කිවයුතු කරුණු | වයස | ස්ත්‍රී පුරුෂ භාවය | කම් කරුවාගේ පන්තිය හෝ ශ්‍රේණිය | ජන ජූලි | පෙබ අගෝ | මාර් සැප් | අප්‍රි ඔක් | මැයි නො | ජූනි දෙ. |
| | | | | | දළ ඉපැයීම් වල එකතුව | දයක මුදල් | දළ ඉපැයීම් වල එකතුව | දයක මුදල් | දළ ඉපැයීම් වල එකතුව | දයක මුදල් | දළ ඉපැයීම් වල එකතුව | දයක මුදල් | දළ ඉපැයීම් වල එකතුව | දයක මුදල් | දළ ඉපැයීම් වල එකතුව | දයක මුදල් | | | | | | | | | | |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු.ශ. | රු. ශ. | රු.ශ. | රු.ශ. | රු. ශ | රු.ශ. | රු.ශ. | රු.ශ. | රු.ශ. | රු.ශ. | රු.ශ. | රු.ශ. | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | මුළු එකතුව ... | | | | | | | | | | | | | | | (11) | | | | | | | | | |

196 ........................................සිට 196 ........................................ දක්වා වූ කාල පරිච්ඡේදයේ දයක මුදල් පිළිබඳ වාරවාර්තාව

සේව යෝජකයාගේ ලියාපදිංචි වීමේ අංක : ........................................

සේව යෝජකයාගේ නම සහ ලිපිනය : ..............................................................

..............................................................

..............................................................

| | රු. | ශ. |
|---|---|---|
| සී (3) ආකෘතියේ එකතුව | | |
| වැඩිපුර අය කිරීම | | |
| 0 වැඩියෙන් ගෙවීම්/අඩුවෙන් ගෙවීම් 0 | | |
| වෙනත් ගෙවීම් ඇතොත් | | |
| එකතුව ... | | |

ඉහත වාර වාර්තාවේ දක්වෙන සියලු විස්තර නිවැරදි බවත් සේවයෝජකයාගේ දයක මුදල් වලින් කිසිම කොටසක් කිසිම සේවකයකුගේ ඉපැයීම් වලින් අඩුකර නොමැති බවත් සහතික කරමි.

........................................

සේව යෝජකයාගේ අත්සන.

(2) "ජී" ආකෘති පත්‍රයේ II වන කොටසෙහි " මෙයින් සපිර කරමි/කරමු" යන වචන අස්කොට ඒ වෙනුවට "......................
..........................................(සේව යෝජකයාගේ නම සහ ලියා පදිංචිවීමේ අංකය සඳහන් කරන්න) වන මම/අපි මෙයින් සපිර කරමි/කරමු" යන වචන යෙදීමෙන් :

(3) "කේ" ආකෘති පත්‍රයේ II වන කොටසෙහි" 19.............. මාසයේ දායක මුදල් පිළිබඳ වාර වාර්තාවට ඇතුලත් කරන ලදී." යන වචන සහ ඉලක්කම් අස්කොට ඒ වෙනුවට පහත සඳහන් වචන සහ ඉලක්කම් යෙදීමෙන් :—

"19.............................. මාසයේ දායක මුදල් පිළිබඳ වාර වාර්තාවට ඇතුලත් කරන ලදී.

*විශ්‍රාම ගත්/මියගිය දිනය තෙක්වූ මෙහි පහත දක්වා ඇති දායක මුදල් ලබා ගන්නා ලද බවත් සේවක අර්ථසාධක අරමුදල් ගණනට මවිසින් මහ බැංකුවට යවන ලද මුදල් වලට ඒ මුදල් ඇතුලත් කරන ලද බවත් මෙයින් සහතික කරමි.

| මාසය | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| මුළු වේතන මුදල | | | | | | | |
| මුළු දයක මුදල | | | | | | | |

*"සී(3)" ආකෘතියේ වාර වාර්තාව එවීමට නියමිත සේව යෝජකයන් විසින් පිරවීමටය.

(4) "ඇල්" ආකෘති පත්‍රයේ 3 වන කොටසේ" ඉල්ලුම්කරුගේම බවට මම සෑහීමට පත් වී සිටිමි" යන වචන අස්කොට ඒ වෙනුවට පහත දක්වෙන වචන යෙදීමෙන්—

"ඉල්ලුම්කරුගේම බවට මම සෑහීමට පත් වී සිටිමි.

*විශ්‍රාම ගත්/මියගිය දිනය තෙක්වූ මෙහි පහත දක්වා ඇති දයක මුදල් ලබා ගන්නා ලද බවත් සේවක අර්ථ සාධක අරමුදලේ ගණනට මවිසින් මහ බැංකුවට යවන ලද මුදල් වලට ඒ මුදල් ඇතුලත් කරන ලද බවත් මෙයින් සහතික කරමි.

| මාසය | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| මුළු වේතන මුදල | | | | | | | |
| මුළු දයක මුදල | | | | | | | |

*"සී(3)" ආකෘතියේ වාර වාර්තාව එවීමට නියමිත සේව යෝජකයන් විසින් පිරවීමටයි.

(5) "කිව් ආකෘති පත්‍රයේ" දයක මුදල් ආපසු ගෙවන ලෙස ඉල්ලීම" යන වචන අස්කොට ඒ වෙනුවට "යම් මුදලක් හෝ දායක මුදලක් ආපසු ගෙවන ලෙස ඉල්ලීම" යන වචන යෙදීමෙන් සහ

(6) "කිව්" ආකෘති පත්‍රයෙන් පසුව ඊළඟටම පහත දක්වෙන අභිනව ආකෘතිය යෙදීමෙන් ද ;

"ආර්" ආකෘතිය

## 1958 අංක 15 දරණ සේවක සාධක අරමුදල් පනත

### 17ඒ නියෝගය යටතේ ප්‍රකාශය

.............................................................. යන ස්ථානයෙහි
පදිංචි දනට ..............................................................
(ප්‍රකාශය ලබා ගන්නා සේවයෝජකයාගේ නම දෙන්න)

යටතේ සේවය කරන ..............................................................
............................ වන මම—

*(1) දනට මා .................................................... යටතේද සේවය කරන බව,

*(2) දනට මා වෙන සේවයෝජකයකු යටතේ සේවය නොකරනු බව ගම්භීරතා පූර්වකව ද අවංකවද ප්‍රකාශ කර සිටිමි.

————,
සේවකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ.

සාක්ෂිය :..............................................................
19 .................................... දිය.

* නොගැලපෙන කොටස කපා හරින්න.

(12) එයට යාකොට ඇති තුන්වන උපලේඛනයෙහි එන "නවාතැන් ගෙයක හෝ තානායමක හෝ සමාජ ශාලාවක" යන වචන අස්කොට ඒ වෙනුවට "නවාතැන් ගෙයක, තානායමක, සමාජ ශාලාවක, බේකරියක, සාත්තු නිවාසයක, වෙළඳ ශාලාවක හෝ කාර්යාලයක" යන වචන යෙදීමෙන් ද යනුයි.

5-275

## කාර්මික සංවර්ධනය

කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරන්නන් සියළු දෙනා විසින් ම තම තමන්ගේ කාර්මික ව්‍යාපාර සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති ශීර්ෂ යටතේ සියළු විස්තර කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ සංඛ්‍යා ලේඛන අංශයට එවිය යුතුයි :—

| නිපදවනු ලබන ද්‍රව්‍ය | නිපදවීමේ ශක්තිය | යොදවා සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |

කර්මාන්ත සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් කිරීමට බලාපොරොත්තු වන ප්‍රගතිශීලි සැලසුම් ක්‍රියාත්මක කිරීම පිණිස ආධාර දීම් වස්, මේ නිවේදනයේ ඉල්වා ඇති විස්තර සැපයීමෙන් සහයෝගය දක්වන මෙන් සියළුම දේශීය කාර්මික ව්‍යාපාරිකයින් ගෙන් ඉල්වා සිටිනු ලැබේ.

මේ සම්බන්ධව සියළුම ලිපි ගනුදෙනු හා අමතර විස්තර ගැන විමසීම් කොළඹ 7, ටොරිංටන් පෙදෙසේ අංක 33, කර්මාන්ත ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සංවර්ධන අධ්‍යක්‍ෂ (සංඛ්‍යා ලේඛන අංශය) වෙත එවිය යුතුයි.

ඩී. සී. එල්. අමරසිංහ,
සංවර්ධන අධ්‍යක්‍ෂක.

සංවර්ධන අංශය,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශය,
33, ටොරිංටන් පෙදෙස,
කොළඹ 7.

5-267

## පොල් නිෂ්පාදන ආඥාපනත

ඒ. රහෙමන් එම්. හාති මහතාගේ ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීම පිණිස 1964 ජූනි 8 වෙනිදයින් අවසාන වන කාලසීමාව සඳහා දෙස්තර හමීඩ් ඒ රහමන් මහතා ලංකා පොල් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පොල් නිෂ්පාදන ආඥාපනතේ (160 පරිච්ඡේදය) 2(1) වගන්තිය යටතේ, පත් කර ඇති බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඊ. තෙන්නකෝන්
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
අතිරේක සපිර ලේකම්.
(වාණිජ අංශය)

කොළඹ, අප්‍රේල් 27, 1962.

5-401

## 1961කේ 22 වෙනි අඞකය දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පනතින් සංශෝධිත 1957 තේ 48 වෙනි අඞකය දරණ මෝටර් ගමනාගමන පනත

### 44 වෙනි වගන්තිය යටතේ කරන දැන්වීමයි

මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද විධිවත් ලෙස ලඞකා ගමනාගමන මණ්ඩලය වෙත පවරාගන්නා ලද්දාවූද දේපොළ වල පවරාගැනීම, 13,027 වෙනි අඞකය හා 1962. 4. 19 වෙනි දිනය දරණ ලඞකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරවන ලද නියෝගවලින් නිෂ්ප්‍රභ කරන ලද බැවින්, ලඞකා ගමනාගමන මණ්ඩලයෙහි සභාපති ධුරන්ධර චාල්ස් බණ්ඩා කුමාරසිංහ වන මම, 1961කේ 22 වෙනි අඞකය දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පනතින් සංශෝධිත 1957 තේ 48 වෙනි අඞකය දරණ මෝටර් ගමනාගමන පනතේ 44 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, ඒ එක් එක් දේපොළ ලඞකා ගමනාගමන මණ්ඩලය වෙත පවරා ගත් දිනය එක්කලාම ඊට කලින් ඒ එක් එක් දේපොළ සම්බන්ධයෙන් අයිතිවාසිකමක් ඇතිව සිටි ඕනෑම කෙනෙකුට ඒ එක් එක් දේපොළ සඳහා එකී පනතේ 21 ඒ වෙනි වගන්තියේ (2 වෙනි) උප වගන්තියේ බී. සී. යන ඡේද අනුව ගෙවිය හැකි මුළු වන්දි මුදලම හෝ ඉන් කොටසක් ඉල්ලා අයදුම් පත්‍රයක් එවන ලෙස මේ නිවේදනය මගින්, විධාන කරමි.

කොළඹ 5 ද පොන්සේකා පාරේ 5 වෙනි ස්ථානයෙහි සිටින (වන්දි අංශයේ) ලේකම් මහතාගෙන් පෝරම ලබාගෙන මේ අයදුම් පත්‍ර ඒ පෝරමවල ලියා 1962 මැයි මාසයේ 11 වෙනි ද සිට මාසයක් ඇතුළතදී ඒ මහතාට ලැබෙන සේ එවිය යුතුයි.

සී. බී. කුමාරසිංහ,
ලඞකා ගමනාගමන මණ්ඩලයේ
සභාපති තැන.

1962 මැයි මස 4 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ,
200 වෙනි ස්ථානයෙහිදීය.

### උපලේඛනය

| දේපොළවල් | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| **1. සීමාසහිත හයිලෙවල් රෝඩ් බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපොළ වල්—** | |
| (ඒ) ප්‍රමාණයෙන් රූඩ් 2 1/2 ක් පමණවූ පුවක්වත්ත නැමැති ඉඩම සහ එම ඉඩමේ පිහිටි සියලු ගොඩනැගිලි. | කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය නම් ගමේ උතුරට ප්‍රධාන පාරය, නැගෙනහිරට යහල්ලගේ කිරිනෝරි සහ සෙස්සන්ට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට ඩබ්ලිව්. ඒ. දෙන් ආගිරිස්ට සහ සෙස්සන්ට අයිති ඉඩමය, බස්නාහිරට මෙම ඉඩමේ ඉතිරි කොටසය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |
| (බී) ප්‍රමාණයෙන් රූඩ් 1 ක් පමණවූ කලහලලන්ද නැමැති ඉඩම සහ එම ඉඩමේ පිහිටි සියලු ගොඩනැගිලි. | කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක නම් ගමේ සර්කියුලර් පාරේ පිහිටි වරිපණම් අංක 5 සහ 15 දරණ දේපොළවල්ය. උතුරට ප්‍රධාන පාරය, නැගෙනහිරට සහ දකුණට මෙම ඉඩමේ ඉතිරි කොටස්ය, බස්නාහිරට පුද්ගලික පාරක්ය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |
| **2. සීමාසහිත රත්නපුර ඔම්නි බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපොළ—** | |
| ප්‍රමාණයෙන් අක්කරයක් පමණවූ ඉහළ වත්ත නැමැති ඉඩම සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි. | කොළඹ දිස්ත්‍රික්කයේ රනාල නම් ගමේ උතුරට ප්‍රධාන පාරය, නැගෙනහිරට කේ. අත්තුම්මාට සහ තවත් අයට අයිති දේපළය, දකුණට ඩී. ලිවේරාට සහ තවත් අයට අයිති දේපළය, බස්නාහිරට ඇම්. ජෝන්ට සහ තවත් අයට අයිති දේපළය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |
| **3. සීමාසහිත කේ. එම්. බී. කේ. බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ—** | |
| ප්‍රමාණයෙන් අක්කරයක් පමණ වූ කෝන්ගහමුල සහ බෝගහවත්ත යන ඉඩම හා එම ඉඩමේ පිහිටි සියලු ගොඩනැගිලි. | මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල නම් ගමේ දඹුල්ල ඇරාවුල පාර අද්දර පිහිටා තිබේ. |
| **4. සීමාසහිත අයිලන්ඩ් බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ—** | |
| ප්‍රමාණයෙන් රූඩ් 3ක් පමණවූ කප්පල් කාරන් සිමාවුම් පෙයියසිමාවුම් නමැති ඉඩම සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි. | යාපන දිස්ත්‍රික්කයේ බටහිර වේලනයි නම් ගමේ උතුරට ගම්සභා පටු පාරය, නැගෙනහිරට එස්. පොන්නප්පා නෝනා මහත්මියගේ දේපළය, දකුණට ප්‍රධාන පාරය, බස්නාහිරට ගම්සභා පටු පාරය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |

11,687 වෙනි අංකය හා 1959යේ පෙබරවාරි මස 28 වෙනි දිනය දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරවන ලද නියෝගයෙන් යථෝක්ත දේපොළවල් 1959 යේ මාර්තු මස 1 වැනි දා පවරාගන්නා ලදහ.

| | |
|---|---|
| **5. සීමාසහිත ශ්‍රී ලංකා බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ—** | |
| රූඩ් 3ක් පමණ වර්ග ප්‍රමාණය ඇති උඩුපිලමූකලාන නමැති ඉඩම. මෙහි වූ සියලු ගොඩනැගිලි සහිතවයි. | කොළඹ දිස්ත්‍රික්කයේ මීගහවත්ත නම් ගමේ උතුරට සහ නැගෙනහිරට ජී. ලිලීනෝනාගේ සහ ඇල්. ඊ. කබ්රාල්ගේ ඉඩමය, දකුණට මහපාරය, බස්නාහිරට: යූ. ඒ. පියසීලිට සහ තවත් අයට අයිති ඉඩමය යන මේ මායිම් තුළ පිහිටා තිබේ. |

12,119 වෙනි අංකය හා 1960වේ අප්‍රියෙල් මස 29 වෙනි දිනය දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරවන ලද නියෝගයෙන් යථෝක්ත දේපොළ 1960වේ මැයි මස 1 වෙනි දා පවරාගන්නා ලදී.

5-367.

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### 1938 අංක 51 දරන සමාගම් ආඥාපනත

#### 277 (5) වගන්තිය යටතේ සීමාසහිත මුරුතෙන්ග එස්ටේට් සමාගමේ නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරන සමාගම් ආඥාපනතේ විධිවිධාන යටතේ 54. 3. 31 දින සංස්ථාපිත සමාගමක් වන සීමා සහිත මුරුතෙන්ග එස්ටේට් සමාගම ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, එ දින සිට තුන් මාසයක් ඉකුත් වූ විට සීමාසහිත මුරුතෙන්ග එස්ටේට් සමාගමේ නම රෙජිස්ටරයෙන් කපා හරින බවට 62.1.26 දින අංක 12,885 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් 62.1.16 දින දරන දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත මුරුතෙන්ග එස්ටේට් සමාගම ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සීමා සහිත මුරුතෙන්ග එස්ටේට් සමාගමේ නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බව ද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බවද්, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරන සමාගම් ආඥාපනතේ 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 1, වෙළඳ සමාගම් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුවේදීය,
5-256.

## 1938 අංක 51 දරන සමාගම් ආඥාපනත

### 277 (5) වගන්තිය යටතේ සීමා සහිත ඊස්ටර්න් රේඩියෝ ඇන්ඩ් ඉලැක්ට්‍රික් සමාගමේ නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරන සමාගම් ආඥා පනතේ විධි විධාන යටතේ 1946. 3. 25 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ඊස්ටර්න් රේඩියෝ ඇන්ඩ් ඉලැක්ට්‍රික් සමාගම ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදක්වුවහොත්, එ දින සිට තුන් මාස යක් ඉකුත් වූ විට, සීමා සහිත ඊස්ටර්න් රේඩියෝ ඇන්ඩ් ඉලැක්ට්‍රික් සමාගමේ නම රෙජිස්ටරයෙන් කපා හරින බවට 62.2.2 දින අංක 12,891 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් 62.1.23 දින දරන දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත ඊස්ටර්න් රේඩියෝ ඇන්ඩ් ඉලැක්ට්‍රික් සමාගම ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නො මැති බැවින් ද,

අද දින, සීමා සහිත ඊස්ටර්න් රේඩියෝ ඇන්ඩ් ඉලැක්ට්‍රික් සමාගමේ නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බව ද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බවද, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් නැත්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරන සමාගම් ආඥා පනතේ 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962-4-30

5-258

---

## 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනත

### 277 (5) වගන්තිය යටතේ සීමාසහිත වෝල්ටර් මෙන්දිස් ඇන්ඩ් කම්පැනි නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරණ සමාගම් ආඥාපනතේ විධිවිධාන යටතේ, 1957.9.13 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත වෝල්ටර් මෙන්දිස් ඇන්ඩ් කම්පැනි ව්‍යාපාරික කටයුතු වල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදක්වුවහොත්, එදින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, සීමාසහිත වෝල්ටර් මෙන්දිස් ඇන්ඩ් කම්පැනි නම රෙජිස්ටරයෙන් කපා හරින බවට 1962.2.2 දින අංක 12,891 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්, 1962.1.26 දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත වෝල්ටර් මෙන්දිස් ඇන්ඩ් කම්පැනි ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සීමාසහිත වෝල්ටර් මෙන්දිස් ඇන්ඩ් කම්පැනි නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බවද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බවද, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් නැත්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනතේ 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 මැයි මස 3 වැනි දින,
වෙළඳ සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹදීය.

5-316

---

## දැන්වීමයි

උතුරු මැද පළාතේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ සුවින්ගල, තඹල, පුදූර් හා තල්පොත ගම්පති කොට්ඨාශවල ගවයින් අතර, "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962 ජනවාරි 12 දින අංක 12,875 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 මැයි 2 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කාර්යාලයේ දීය.

5-259/1

---

## දැන්වීමයි

උතුරු මැද පළාතේ පොළොන්නරු දිස්ත්‍රිකක්යේ තමන්කඩුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මැද පත්තුවේ ගවයින් අතර, "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962 ජනවාරි 26 දින අංක 12,885 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 මැයි 2 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කාර්යාලයේ දීය.

5-259/2

---

## රථවාහන ගමනා ගමනයට බාධා

### කළුතර දිස්ත්‍රික්කය—නාහල්ල-කලවැල්ලාව-මාර්ගය

අංක 3/1 දරන පාලම, නැවත සෑදීම පිණිස ඉහත සඳහන් මාර්ගය නැවත දන්වනතුරු, රථ වාහන ගමන් කළ නොහැකි වන ලෙස වසා ඇත.

මතුගම-කලවැල්ලාව හරහා නාහල්ල මාර්ගය වෙනුවට යොදා ගත හැකි මාර්ගයයි.

වී. ඊ. හේරත්
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 මැයි මස 3 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේ දීය.

5-404

---

## විශෙෂ නිවේදනයයි

1962 මැයි 18 වෙනි සිකුරාදා සහ 19 වෙනි සෙනසුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1962 මැයි 17 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 මැයි 12 වැනි සෙනසුරාදා දවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 මැයි 4 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි